රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2023

මගේ අංකය : EST-5/04/PCY/0035
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.12.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3:9 උප වගන්තියට අදාළ වන දඬුවමක් ඇතුළත් විනය නියෝගයක දී වැටුප් වර්ධක අඩු කිරීම ක්‍රියාත්මක කළ යුතු ආකාරය</u>**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 23:9 උපවගන්තියට අනුව විනය නියෝගයක් මඟින් ලබා දී ඇති දඬුවමක් ක්‍රියාත්මක කළ යුත්තේ නිලධරයා විසින් වරද සිදු කළ දින සිට ය. ඒ අනුව විනය නියෝගයක් මඟින් වැටුප් වර්ධක ප්‍රමාණයක් අඩු කිරීමට තීරණය කර ඇති විටක වරද සිදු කළ දිනය වන විට නිලධරයා ලබාගෙන ඇති වැටුපෙන් විනය නියෝගයේ සඳහන් වැටුප් වර්ධක සංඛ්‍යාවේ අගය අඩු කිරීමෙන් පසුව ලැබෙන වටිනාකමට අදාළ වන වැටුප් පියවරේ එම නිලධරයා වරද කළ දිනට පිහිටුවීම කළ යුතු ය. මෙහි දී අඩු කළ යුතු වැටුප් වර්ධක සංඛ්‍යාව වරද සිදු කළ දිනය වන විට නිලධරයා විසින් උපයාගෙන තිබූ අනුගාමී වැටුප් වර්ධක විය යුතු ය. මේ ආකාරයට අඩු කරන වැටුප් වර්ධක සංඛ්‍යාව නිලධරයාට සම්පූර්ණයෙන් ම අහිමි වන අතර, එය ප්‍රතිසාධනය (Restoration) කළ නොහැකි ය.

02. මේ බව පහත උදාහරණය මඟින් පැහැදිලි කළ හැකි ය.

උදා:- ස්වකීය වැටුප් වර්ධක දිනය අගෝස්තු 01 වන නිලධරයෙකු 2015.08.01 දින වන විට 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(IV)හි MN-2-2006(ඒ) වැටුප් පරිමාණයේ රු. 15,150/-ක සම්පූර්ණ මාසික වැටුප් පියවරක් ලබන්නේ යැයි ද, එම වැටුප් පරිමාණයේ ලබමින් සිටි වැටුප් වර්ධකයේ වටිනාකම රු.145/- යැයි ද, එම නිලධරයා රු.14,715/-ක වැටුපක් ලබමින් සිට 2012.10.15 දින සිදු කළ වරදකට 2015.12.10 දින චෝදනා පත්‍රයක් නිකුත් කර ඇතැයි ද උපකල්පනය කළ විට,

ගෙවා ඇති වැටුප,

2012.08.01 —රා.ප.ච.06/2006(IV)→ රු.14,715/-
2013.08.01 → රු.14,860/-
2014.08.01 → රු.15,005/-
2015.08.01 → රු.15,150/-
(2013.08.01 – 2015.08.01: චෝදනා පත්‍රය නිකුත් කර නොමැති බැවින් වැටුප් වර්ධක ගෙවා ඇත)

2016.01.01 —රා.ප.ච.03/2016→ රු.18,388/- + රු.9,792/-(ගැලපුම් දීමනාව)
2016.08.01 → රු.18,388/- + රු.9,792/-(ගැලපුම් දීමනාව)
(චෝදනා පත්‍රය නිකුත්ව ඇති බැවින් වැටුප් වර්ධක නතර කර ඇත.)

අනතුරුව වැටුප් වර්ධක 05ක් අඩු කිරීමට විනය නියෝගය ලැබී ඇතැයි උපකල්පනය කළ විට, වරද කළ 2012.10.15 දින සිට වැටුප් වර්ධක 05ක් එනම්, 2012, 2011, 2010, 2009 හා 2008 වර්ෂයන් සඳහා අදාළ වැටුප් වර්ධක 05 අඩු කළ යුතු වේ. එවිට වැටුප් සැකසීම පහත පරිදි වේ.

2012.08.01 —රා.ප.ච.06/2006(IV)→ රු.14,715/-

2012.10.15 ——→ රු.13,990/- (වැටුප් වර්ධක 05ක් අඩු කළ පසු)

2013.08.01 ——→ රු.14,135/-

2014.08.01 ——→ රු.14,280/-

2015.08.01 ——→ රු.14,425/-

2016.01.01 —රා.ප.ච.03/2016→ රු.17,508/- + රු.9,831/-(ගැලපුම් දීමනාව)

2016.08.01 ——→ රු.17,684/- + රු.9,822/-(ගැලපුම් දීමනාව)

2012.10.15 දින නිලධරයාගේ වැටුප වැටුප් වර්ධක 05කින් සංඛ්‍යාත්මකව අඩු කිරීම කළ යුතු අතර එදිනට පෙර කාලයට අදාළව කිසිදු මුදලක් නිලධරයාගෙන් අය නොකළ යුතුය. 2012.10.15 (එදින ද ඇතුළත්ව) දිනෙන් පසු වැඩිපුර ගෙවා ඇති මුදල අය කළ යුතු ය.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව මෙම චක්‍රලේඛ ලිපිය නිකුත් කෙරේ .


කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk